ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL' S DEPARTMENT

නො.07,ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7 ,கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ෆැක්ස්. / பெக்ஸ் / Fax: 2684051

ඊමේල් / ஈ - மெயில் / E-mail: Landcom@sltnet.lk

මගේ අංකය / எனது இல / MY NO: 4/10/වකුලේඛ/2005/03

ඔබේ අංකය / உமது இல / YOUR NO:

දිනය / திகதி / DATE: 2005.03.

සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන් /ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී හමුදා සහ පොලිස් සේවයේ ආබාධිත වූ සහ මියගිය නිලධාරීන්ගේ පවුල්වල යැපෙන්නන්ටද, දැනට සේවයේ යෙදී සිටින හමුදා සහ පොලිස් සේවාවන්හි නිලධාරීන්ට ද නිවාස සඳහා**
**<u>රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය</u>**

ඉහත සඳහන් නිලධාරීන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා රජයේ ඉඩම් ලබාදීමේදි ගතයුතු ක්‍රියා මාර්ගය පැහැදිලි කරමින් අතිගරු ජනාධිපතිතුමිය විසින් 2002.12.26 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 02/2369/100/043 ට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත.

I ඒ අනුව ත්‍රිවිධ හමුදාවන්හි හෝ පොලිස් සේවයේ නියුතු නිලධරයන් අතුරින් හමුදාපතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් නිර්දේශ කරනු ලබන අය සඳහා ඉඩමෙ තක්සේරු වටිනාකමින් 10% ක් පමණක් අයකර ඉඩම ලබාදීමටත් ,

II දැනටමත් ඉඩම ලබාදී ඇති අයගෙන් 10% ක වටිනාකම පමණක් අයකර ගෙවීමට ඇති ඉතිරි මුදල් කපා හැරීමටත්,

තිරණය කර ඇත. මෙ සඳහා රජයේ ඉඩම ආඥා පනතේ 13 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත පරිදි කටයුතු කිරීමට එකඟත්වය දී ඇති බැවින් එම නියෝග අනුව කරුණාකර කටයුතු කරන්න.

මෙහිදී ඉඩමෙ වටිනාකමින් ගෙවිය යුතුව ඇති 10% ක මුදල එකවර ගෙවන්නේ නම් දීමනා පත්‍රයක් යටතේ ඉඩම ලබා දීමට කටයුතු කළ යුතුය. එකී මුදල වාරික වශයෙන් ගෙවන්නේ නම් පළමුව දීර්ඝකාලීන බද්දක් යටතේ ඉඩම ලබාදී නියමිත මුදල ගෙවා නිම කළ පසු දීමනා පත්‍රයක් ලබා දීමට කටයුතු කළ යුතුය.

එස්.ජේ.පතිරණ,
ඉඩම කොමසාරිස් ජනරාල්.

පිටපත්:-
1. ජනාධිපති ලේකම්.
2. රාජ්‍ය ආරක්ෂක ලේකම්.
3. කෘෂිකර්ම , පශු සම්පත් ඉඩම හා වාරිමාර්ග ලේකම්.
4. සියළුම හමුදාපතිවරුන් .
5. පොලිස්පති.
6. දිස්ත්‍රික් ලේකම්වරුන්
7. ප්‍රාදේශීය කාර්යාල වල සියළුම මාණ්ඩලික නිලධාරීන්